සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2025

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

I පත්‍රය

කාලය පැය 01 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි


පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	


	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	
	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	
	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමි.	
	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය.	
	V/II/S/CH

ලබා දෙන දිනය - 2025 පෙ.ව. 10.00 සිට පෙ.ව. 11.00 10.45 *[දෙවැනි පිටුව බලන්න.*


01. පහත රූප තුන අතුරෙන් එකක වෙනසක් ඇත. එම රූපය තෝරන්න.

1. 

2. 

3. 


02. පහත රූපවලින් දැක්වෙන ඒවා අතර ඇති හොඳම සම්බන්ධතාවය මත කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි ආකාරය කුමක් ද?





A B C D E F


1. ADE සහ BCF
2. BCD සහ AEF
3. ACE සහ BDF

03. පහත රූපයෙහි A සහ B ලෙස සටහන් කර ඇති හිස්තැන් සඳහා පිළිවෙළින් ගැළපෙන රූප කොටස් දෙක මොනවා ද?




1. 
2. 
3. 

04.  කොටුව තුළ ඇති රූපය සකස් කර ගැනීම සඳහා ඒ අයුරින් ම යොදාගත යුතු රූප දෙක මොනවා ද?



A



B



C




D

1. A සහ C
2. B සහ D
3. B සහ C


05. ඔරලෝසු මුහුණතක් කැබලි හතරකට කැඩිණි. ඉන් එක කැබැල්ලක් තනි ඉලක්කමක් ලෙස කැඩුණි. එක් කැබැල්ලක 6 , 7 , 8 අංක දක්නට ලැබුණි. අනෙක් කැබලි දෙකේ එකතුව 43 සහ 12 විය. තනි ඉලක්කම ලෙස කැඩුණු කැබැල්ලට අයත් අංකය වනුයේ,

1. 2 2. 9 3. 11

06.  නම්

 = ? වීමට


? ඇති තැනට සුදුසු පිළිතුර කුමක් ද?

1.  2.  3. 

07. ප්‍රශ්න පත්‍ර 1 සිට 100 තෙක් තිබූ ප්‍රශ්න පත්‍ර මිටියකින් අංක 35 සිට 55 තෙක් තිබූ ප්‍රශ්න පත්‍ර ප්‍රමාණය ඉවත් කරන ලදී. ඉවත් කරන ලද ප්‍රශ්න පත්‍ර ගණන හැර ඉතිරි ප්‍රශ්න පත්‍ර ගණන කීය ද?

1. 21 2. 80 3. 79

✷ **දී ඇති රූප සටහන ඇසුරින් අංක 08 සහ 09 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**




08. නිවැරදි ප්‍රකාශය තෝරන්න.


1. කවීන්ගේ දකුණු අත පැත්තෙන් රනීෂා සිටියි.
2. නිමාෂි සිටින්නේ රනීෂාගේ දකුණු අත පැත්තෙනි.
3. අනුහස්ගේ වම් අත පැත්තෙන් කවීන් සිටියි.


09. එක පෙළට සිටින විට දකුණු අත මත දකුණු අත තබා ගත නොහැකි යහළුවන් දෙදෙනා කවුද?

1. කවීන් සහ අනුහස් 2. රනීෂා සහ කවීන් 3. භාග්‍යා සහ ප්‍රවීන්

✷ **සංඛ්‍යා යෙදී ඇති රටාව අනුව ප්‍රශ්න අංක 10 සහ 11 ප්‍රශ්නවල හිස්තැනට අදාළ පිළිතුර තෝරන්න.**


10. 





1. 64 2. 62 3. 58

11.



රටාව තේරුම් ගෙන x සහ y වල අගය පිළිවෙළින්,

1. 100 , 150 2. 150 , 180 3. 100 , 120

12. 12 දෙනෙක් වෘත්තාකාර මේසයක් වටා සමාන පරතර සහිතව සිටගෙන සිටිති. එසේ නම් 3 වන පුද්ගලයාට ඉදිරියෙන් කීවෙනි පුද්ගලයා සිටිත් ද?

1. 8 2. 9 3. 10

✷ **අම්මා සහ තාත්තා තම දරුවන් සිව්දෙනා සමඟ අනුරාධපුර යාමට අර්ධ සුඛෝපභෝගී බස්රථයෙන් යෑමට පිටත් විය. මෙහිදී වැඩිහිටි ටිකට් පත්‍රයක මිලෙන් බාගයක මුදලක් එක් දරුවෙක් වෙනුවෙන් ටිකට් පත් සඳහා වියදම් කළ යුතුය. මෙහිදී ඔවුන් සියලු දෙනාට ම යාමට සහ ඒමට රුපියල් 1680 ක මුදලක් වියදම් කරන ලදී.**

13. ඔවුන් අනුරාධපුරය යාම සඳහා වියදම් කළ මුළු මුදල කීය ද?

1. රුපියල් 1680.00 2. රුපියල් 840.00 3. රුපියල් 890.00

14. ඔවුන්ගේ එක් දරුවෙකු වෙනුවෙන් එක් ටිකට් පතක වියදම කීයක් විය හැකි ද?

1. රුපියල් 140.00 2. රුපියල් 105.00 3. රුපියල් 160.00

15. පැයකට මිනිත්තු 5ක් අඩුවෙන් ගමන් කරන ඔරලෝසුවක පෙරවරු 6.00 ට නිවැරදි ව වේලාව තැබුවේ නම් පස්වරු 4.00 වන විට එම ඔරලෝසුවේ තිබිය යුතු වේලාව කීය ද?

1. පස්වරු 2.20 2. පස්වරු 3.10 3. පස්වරු 3.15

✷ **පහත සඳහන් කවිය ඇසුරෙන් ප්‍රශ්න අංක 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

<u>සඳු</u> කුමරා එබී බලයි
සිනා සිසී තරු බබළයි
සිහින් සුළං පවන් සලයි
මා වවුලෝ <u>කෑම</u> සොයයි

16. කවි පදවලින් කියැවෙන්නේ දවසේ කුමන කාලයක් ද?

1. සැන්දෑවක් 2. උදෑසනක් 3. රාත්‍රියක්

17. ඉරි ඇඳි පදවලට සමාන අදහසක් ගෙන දෙන පද පිළිවෙළින් තෝරන්න.

1. ආහාර , හිරු 2. තරිඳු , ආහාර 3. නුඹ , ආහාර

✷ **අද සෙනුසුරාදා ය. නාමල් නුවරඑළියේ ගියේ පළමුදා ය. ඉන් අනිද්දා දිනය වන්නේ 25 වෙනිදා ය. එදින බිමල්ගේ උපන් දිනයයි.**


18. නාමල් නුවරඑළියේ ගිය දිනය හා දවස කවදා ද?

1. 20 බ්‍රහස්පතින්දා 2. 18 අඟහරුවාදා 3. 19 බදාදා

19. බිමල්ගේ උපන්දිනය යෙදෙන දවස කවදා ද?


1. සඳුදා 2. අඟහරුවාදා 3. බදාදා

20. එක්තරා නගරයක ස්ථාන කිහිපයක පිහිටීම සිතියමේ දැක් වේ. ඒ අනුව A සිට D දක්වා ගමන් කරන අයෙක් සම්බන්ධ නිවැරදි කියමන කුමක් ද?



1. වම් පැත්තට හැරෙන වාර ගණන දකුණු පැත්තට හැරෙන වාර ගණනට වඩා වැඩි ය.
2. දකුණු පැත්තට හැරෙන වාර ගණන වම් පැත්තට හැරෙන වාර ගණනට වඩා වැඩි ය.
3. වමට හා දකුණු පැත්තට හැරෙන වාර ගණන සමාන ය

21. මුලින් දී ඇති තරාදි දෙක ඇසුරින් තුන්වෙනි තරාදියේ හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.



1. 100 2. 90 3. 120

22. සිරස් බිත්තියක රඳවා ඇති බිත්ති ඔරලෝසුවක වේලාව 3.00 වන විට එහි පැය කටුව නැගෙනහිර දිශාවට යොමු වෙයි. මෙම ඔරලෝසුවට හරි කෙළින් ඉදිරියෙන් සිටගෙන වේලාව බලන කුසුම් පිටුපා සිටින්නේ කුමන දිශාවට ද?

1. උතුර 2. දකුණ 3. නැගෙනහිර

23. මල්ලක පාට තුනක බෝල දමා ඇත. රතු පාට බෝල ගණන 8 කි. ඉතුරු බෝල වලින් $\frac{1}{3}$ක් නිල් පාට බෝල ය. ඉතුරු බෝල ගණන 12 කි. එහි තිබූ නිල් පාට බෝල ගණන කීය ද?

1. 6 2. 8 3. 10

24. එහි තිබූ මුළු බෝල ගණන කීය ද?

1. 28 2. 26 3. 24

25. ''මට ඉන්නේ අයියා කෙනෙකුයි අක්කා කෙනෙකුයි විතරය. අපේ අම්මටයි තාත්තටයි පුතාලා දෙන්නෙකුයි දුවෙකුයි ඉන්නවා.'' යනුවෙන් ළමයෙක් ප්‍රකාශ කරයි. ඒ අනුව එම ළමයා පවුලේ කවුරුන් විය හැකි ද?


1. බාල දියණිය 2. බාල පුතා 3. වැඩිමහල් පුතා

26. මේසයක් උඩ චොක්ලට් , ස්ටෝබෙරි සහ දිවුල් අයිස් ක්‍රීම් 3 ක් ඇත. අමාලි චොකලට් හා දිවුල් අයිස් ක්‍රීම් වලට කැමති අතර තරිඳු චොක්ලට් අයිස්ක්‍රීම් වලට කැමති ය. නිෂාම් අයිස්ක්‍රීම් තුනට ම කැමති ය. තුන්දෙනාම කැමති විදියට අයිස්ක්‍රීම් බෙදුවේ නම් අමාලිට ලැබෙන අයිස්ක්‍රීම් වර්ගය කුමක් ද?

1. චොක්ලට් 2. ස්ටෝබෙරි 3. දිවුල්

27. එක් පෙට්ටියක බෝල 6 බැගින් බෝල 480 ක් පෙට්ටිවල අසුරා තිබූ අතර ඉන් පෙට්ටි කිහිපයක් සිසුන් අතර බෙදා දුන් අතර ඉතුරු වූ පෙට්ටි සියල්ල ම පහත දැක් වේ. එසේ නම් සිසුන් සඳහා බෙදා දුන් පෙට්ටි ගණන සහ එම පෙට්ටිවල ඇති බෝල ගණන පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

1. 45 සහ 280
2. 66 සහ 396
3. 52 සහ 312



28. කුමාරි ඇය අත තිබූ මුදලින් හරි අඩක් වියදම් කර පැන්සල් පෙට්ටියක් මිල දී ගත්තා ය. ඉතිරි මුදලින් අඩක් වියදම් කර පාට පෙට්ටියක් මිල දී ගත් පසු ඇය අත රුපියල් 185ක් ඉතුරු විය. ඇය අත මුලින් තිබූ මුදල කීය ද?

1. රුපියල් 370.00
2. රුපියල් 420.00
3. රුපියල් 740.00

29. ළමයි පේළියක නිමාලි 13 වෙනියා වූ අතර ඇය පේළියේ හරි මැද සිටියි. සුපුනි පේළියේ 14 වෙනියා ය. සුපුනි පේළියේ හරි මැද සිටින ළමයා බවට පත් කිරීමට කළ යුතු වෙනස්කම දැක්වෙන පිළිතුර වන්නේ,

1. පසුපසට තවත් එක් ළමයෙකු දැමීම.
2. ඉදිරියෙන් සිටින ළමයා පේළියේ අන්තිමට දැමීම
3. ඉදිරියට හා පසුපසට එක් ළමයෙකු බැගින් දැමීම

30. වට්ටියක සමාන ප්‍රමාණවලින් රතු , කහ , සුදු වර්ණවලින් යුත් මල් ඇත. එයින් වරකට සුදු මල් දෙකක් ද කහ මල් තුනක් සහ රතු මල් 1 ක් බැගින් ඉවතට ගනු ලබයි. මෙලෙස වාර හතරක් ගත් විට වට්ටියේ තිබූ කහ මල් අවසන් වූයේ නම් වට්ටියේ ඉතිරි වූ මල් ගණන කීය ද?

1. 10
2. 12
3. 14

31.


ව	ද	සෑ	වැ
ර	රු	න්	
ලි		පු	මු
	ඳු		න්

ම	රෙ	ද	ස
කු	ව	ට	
හ		හැ	මු
	ණ		ට

පළමු වගුවේ ඇත්තේ ''රුවන්වැලි සෑ රඳුන් පුදමු'' යන පණිවිඩය ලියා ඇති ආකාරයයි. එම රටාව හඳුනාගෙන දෙවන වගුවේ ලියා ඇති පණිවිඩය කුමක් ද?

1. දකුණට සහ වමට හැරෙමු.
2. වමට සහ දකුණට හැරෙමු
3. වමට සහ දකුණට හැරෙන්න.


32. රූප සටහන ඇසුරින් පිළිතුරු සපයන්න.



උදෑසන 7.30ට රුවනි ගේට්ටුවෙන් පාසලට ඇතුළුවන විට රුවනිගේ සෙවණැල්ල රුවනිගේ ඉදිරියෙන් තිබුණේ නම් කොස් ගස පිහිටා ඇත්තේ පාසල පිහිටි භූමියේ කුමන දිශාවෙන් ද?

1. උතුරු දිශාවෙන් 2. නැගෙනහිර දිශාවෙන් 3. දකුණු දිශාවෙන්

33. පහත රූපයේ ඇත්තේ කුඩා සමචතුරස්‍රවලින් සාදා ගන්නා කොටු ජාලයකි. මෙම කොටු එකිනෙකට වෙන් කළ හැකි ය. මෙහි ඇති කුඩා සමචතුරස්‍ර උපරිම සංඛ්‍යාවක් යොදා ගෙන සමචතුරස්‍රයක් සෑදිය යුතුය. එසේ සෑදීමේ දී ඉවත් වන කුඩා කොටු ගණන කීයද?



1. 12
2. 14
3. 15

✷ **කොටුව තුළ ඇති සංඛ්‍යා ඇසුරින් අංක 34 හා 35 ප්‍රශ්නවලට පිළිතුර තෝරන්න.**

365	276	534
235	704	

34. සංඛ්‍යා සියල්ලම ලිවීමේ දී භාවිතා කොට නොමැති ඉලක්කම් ගණන වන්නේ,

1. 2 කි 2. 3 කි 3. 4 කි


35. මෙහි සංඛ්‍යා දෙකක් පමණක් භාවිත කොට එකතු කිරීම් කළ විට එකිනෙකට වෙනස් පිළිතුරු ලබා ගත හැකි අවස්ථා ගණන වන්නේ,

1. 9 කි 2. 10 කි 3. 12 කි

36. වෘත්තාකාර පිට්ටනියක් වටා මීටර 9 න් 9 ට පරතරය සිටින සේ කණු 8 ක් සිටුවා ඇත. එම කණු ඉවත්කර නැවත පිට්ටනිය වටා මීටර 12 න් 12 ට කණු සිටුවන ලදි. එසේ සිටුවීමට අවශ්‍ය කණු ගණන කීය ද?

1. 6 2. 7 3. 8

37. පහත රූපවලින් B කොටසේ වට ප්‍රමාණය මෙන් $\frac{1}{3}$ ක් A කොටසේ වට ප්‍රමාණය වේ. A කොටස් වට ප්‍රමාණය මෙන් දෙගුණයක් C කොටසේ වට ප්‍රමාණය වේ. සෑම කොටසකම වටේට මල් පේළියක් සමාව දුරින් ඇඳ ඇත. B කොටස වටේ ඇති මල් ප්‍රමාණය 24 කි. එසේ රූප තුනේ ම වට ප්‍රමාණයට ඇඳිය හැකි මුළු මල් ගණන කීය ද?



1. 36 2. 48 3. 54

38. පහත සඳහන් කවියෙන් කියැවෙන්නේ,

කඳු මුදුනේ සිට	හැලෙනා
දුහුල් සළුව මෙන්	දිලෙනා
ගඟට දිය ගෙන	එනා
ගමේ සිරිය	නුඹයි

1. ගඟක් ගැන 2. දිය ඇල්ලක් ගැන 3. ගං ඉවුරක් ගැන

✷ **එකම ස්ථානයක රැකියාවක නිරතවන නිමාලි සහ චතුරි මාර්තු මාසයේ රැකියාවේ නිරත වුයේ පහත පරිදි ය.**

නිමාලි →	**මාර්තු 3 සිට මාර්තු 18 තෙක්**
චතුරි →	**මාර්තු 9 සිට මාර්තු 28 තෙක්**

39. මොවුන් දෙදෙනාම ඉහත ආකාරය එක දිගට ම රැකියාවේ නිරත වුයේ නම්, නිමාලිට වඩා චතුරි වැඩ කළ දින ගණන වන්නේ,

1. 6 2. 5 3. 4

40. මොවුන් දෙදෙනා තනි තනිව වැඩ කළ දින ගණනේ එකතුව වන්නේ,

1. 14 2. 15 3. 16

සබරගමුව පළාත් ප්‍රාථමික අධ්‍යාපන ඒකකය

සිසු සවිය 2025

5 ශ්‍රේණිය

පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වන පහ ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය

II පත්‍රය

කාලය පැය 01 යි මිනිත්තු 15 යි

මෙය විභාගයක් නොවන අතර දරුවන්ගේ සාධන මට්ටම පරීක්ෂා කිරීම සඳහා පමණි.

විභාග අංකය : .....

විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් -

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න **61** ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
* **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
* පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න**.
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
අවසාන ලකුණු	
එකතුව ඉලක්කමෙන්	
එකතුව අකුරෙන්	

	කෙටි අත්සන හා සංකේත අංකය
පළමුවන පරීක්ෂක ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍ර ඇගයීම කළ බව සහතික කරමි.	V/II/S
දෙවන පරීක්ෂක පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි.	V/II/S
ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක ඇගයීම් කර , ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණු නිවැරදි බව සහතික කරමි.	V/II/S/EMF
ප්‍රධාන පරීක්ෂක අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණු නිවැරදි ය.	V/II/S/CH

ලබා දෙන දිනය - 2025.04.02 *පෙ.ව. 08.30 සිට පෙ.ව. 9.45* *[දෙවැනි පිටුව බලන්න.*

01. පහත සඳහන් ඡේදය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

එදා සෙනසුරාදා දවසකි. සුරංග සහ නිශාමි උදෑසනින් ම අවදි වූහ. මල් ගස්වලට සාත්තු කරමින් සිටි ආච්චි අම්මා දැක සුරංග සහ නිශාමි ඇය අසලට දිව ගියහ.

''ඊයේ සේනක මාමා ආව වෙලාවේ මටයි නංගිටයි සීනියාස් මල් ඇට ගෙනත් දීලා ගියා. ඒ මල් ඇට ටික පාත්තියේ තවාන් දාන්න තියෙනවා ආච්චි අම්මේ'' යැයි සුරංග පැවසුවේ ය. නිවස තුළට ගිය <u>නිශාමි මල් ඇට අතට ගත්තා ය.</u>

1. උදෑසනින් ම අවදි වූයේ කවුරුන් ද? .....
2. ආච්චි අම්මා කුමක් කරමින් සිටියේ ද? .....
3. ඡේදයේ සිද්ධියට අනුව ඊයේ යනු කුමන දවසක් ද? .....
4. සේනක මාමා ගෙනත් දුන්නේ මොනවා ද? .....
5. ඡේදයේ ඉරි ඇඳි වැකිය වර්තමාන කාලයට හරවා ලියන්න.

   .....
6. ඡේදයේ සඳහන් මූර්ධජ අක්ෂරයක් ලියන්න. .....

02. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණු ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

1. රුවන් වේදිකා නාට්‍යයක් නරඹයි. ( )
2. අපි ගීත ගායනා කළෙමි. ( )
3. කුඹුරට බැසගත් ගොවියෝ වැඩ කළහ. ( )
4. වර්ෂාව නිසා ගස් කඩා වැටුණෝ ය. ( )
5. අම්මා රසවත් කෑමක් සෑදුවා ය. ( )

03. දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.

ගිය / නිශාදි / වල් / ගැලෙව්වා ය/ගොවිපොළට / පැළ

.....

04. පහත සඳහන් වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.

ගායකයා ගීත ගායනා කළේ ය.

.....

05. ගැළපෙන විරාම ලකුණු යොදන්න.

සීයේ අදත් කතන්දරයක් කියන්නකෝ නංගී අයැද සිටියා ය.

06. පහත ඉඟි වැකියෙහි අදහස ලියන්න.

එක හුස්මට - .....

07. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කරන්න.

..... ගෙම්බා වගේ.

08. **පහත ප්‍රස්තා පිරුළෙහි අදහස ලියන්න.**

ඉඟුරු දී මිරිස් ගත්තා වගේ.

.....

09. **අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදුණු වචනය තෝරා ඉරක් අඳින්න.**

1. ආභරන , ලපටි , ප්‍රකාශන
2. කොට්ඨාශය , වලාකුළු , අව්රැල්ල
3. සාර්තක , අවුව , එළවළු

10. **පහත සඳහන් එක් එක් වචනයට ගැළපෙන සමාන පදයක් බැගින් ඉදිරියෙහි ඇති තිත් ඉර මත ලියන්න.**

1. පොත - ..... 2. දිවයින - .....

11. **පහත පුරුෂ ලිංග නාම පදයට අදාළ ස්ත්‍රී ලිංග නාම පදය ලියන්න.**

කොටියා - .....


12. **සුදුසු යුගල පදය ලියන්න.**

..... පහල (**ලකුණු 26**)

13. **එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහල අක්ෂරවලින් ලියන්න.**

1. mango - ..... 2. peacock -.....

14. **එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය දී ඇති කොටුව තුළ ඉංග්‍රීසි අකුරෙන් ම ලියන්න.**

1. 

2. 

15. **පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.**

1. am / helping /mother / my / I

.....

2. is / a / This / tree / mango

.....

16. **'' එණ්බදු''** යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....

17. **'' මට වතුර එපා''** මෙම වාක්‍යය දෙමළ බසින් කියවන ආකරය සිංහල අකුරුවලින් ලියන්න.

.....

(**ලකුණු 8**)

18. සංඛ්‍යා නාමය ලියන්න.

1. 24 149- .....

2. එකස්ථානය 6 , දහයස්ථානයේ 0 , සියයස්ථානය 7 , දහසස්ථානය 4 ලෙස වන සංඛ්‍යාවේ සංඛ්‍යාංකය ලියන්න.

.....

19. දී ඇති සංඛ්‍යා අවරෝහණ පටිපාටියට ලියන්න.

45 978 , 54 193 , 48 015 - .....

20. පොල් වත්තකින් ජනවාරි මාසයේ දී කඩන ලද පොල් ගෙඩි ගණන 2854 ක් ද පෙබරවාරි මාසයේ දී පොල් ගෙඩි 4798 ක් ද කඩන ලදී. මාස දෙකේම කඩන ලද මුළු පොල් ගෙඩි ගණන කීය ද?

.....

21. බැරලයක පොල් තෙල් ලීටර 50 ක් තිබුණු අතර එයින් සතියක් තුළ පොල් තෙල් විකිණීමෙන් පසු ඉතුරු වූ ප්‍රමාණය $9l\ 750ml$ ක් වේ. සතිය තුළ දී විකිණී ඇති පොල් තෙල් ප්‍රමාණය කොපමණ ද? .....

22. පහත බිල්පත සම්පූර්ණ කරන්න.


ද්‍රව්‍ය	**1kg මිල** **රුපියල් සත**	**ගත් ප්‍රමාණය**	**වටිනාකම** **රුපියල් සත**
අල	240 00	250g	.....
කරවල	600 00	.....	300 00
බෝංචි	.....	200g	100 00
තේ කොළ	800 00	100g	.....
		මුළු මුදල	**.....**

ඉහත බිල්පත සඳහා රුපියල් 1000 ක මුදලක් මුදලාලිට දුන්නේ නම් ඉතුරු මුදල කීයද?

.....

23. 1. එකිනෙකට සමාන ත්‍රිකෝණ හතරකින් සහ දාර හයකින් සැදී ඇති ඝන වස්තුවේ නම කුමක් ද? .....

2. පහත ඝන වස්තුවේ නම කුමක් ද?




.....

24. සරඹ සංදර්ශනයකට සහභාගී වූ එක් සිසුවෙකුට හතර බැගින් බැලුන් 932 ක් බෙදා දෙන ලදී. සරඹ සංදර්ශනය සඳහා සහභාගි වූ සිසුන් ගණන කීය ද? .....

25. දී ඇති රෝම සංඛ්‍යාංකයට පෙර හා පසු රෝම සංඛ්‍යාංකය ලියන්න.

..... ix .....

26. 1. පහත රූපයෙන් ¾ ක් අඳුරු කර දක්වන්න.



2. පෙට්ටියක අඹ ගෙඩි 64 ක් තිබුණු අතර එයින් $\frac{2}{4}$ක් ඉදී තිබුණි. අමු අඹ ගෙඩි ගණන කීය ද? .....

27. රටාව හඳුනාගෙන හිස්තැන් පුරවන්න.

..... , 133 , 142 , 151 , ...

28. උරයක සිමෙන්ති 43kg 400g තිබුණි. කාණුවක් බැඳීමට සිමෙන්ති ගෙන ඉතුරු වූ ප්‍රමාණය 18kg 800g ක් විය. කාණුව බැඳීමට ගෙන තිබූ සිමෙන්ති වල බර කොපමණද?

.....

29. 1. පහත සඳහන් ඔරලෝසු මුහුණතෙහි දැක්වෙන වේලාව උදේ වරුවකි. එම වේලාව දක්වන්න.



.....

2. කුමාරි ගමනක් යාම සඳහා පැය 2 මිනිත්තු 20 ක් ගත විය. එම කාලය මිනිත්තුවලින් කොපමණ ද? .....

30. කූඩයක වෙරළු ගෙඩි 87 ක් තිබුණු අතර එවැනි කූඩ 5 ක වෙරළු ගෙඩි කීය ද? .....

✷ **ප්‍රශ්න අංක 31 සිට 60 දක්වා ඇති ප්‍රශ්නවලට ගැළපෙන නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

31. කාල සටහනකට අනුව කටයුතු කිරීමෙන් ලැබෙන වාසියකි.

1. කාලය උපරිම ප්‍රයෝජනයට ගැනීම නොහැකි වීම.
2. යම් කාර්යයක් ඵලදායීව වඩාත් පහසුවෙන් කරගත හැකි වීම.
3. කාලය නිකරුණේ නාස්ති වීම.

32. ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට රජය විසින් නොමිලේ සපයන සේවා දෙකක් වන්නේ,

1. අධ්‍යාපනය සහ දුරකථන සේවය
2. තැපැල් සේවය සහ සෞඛ්‍ය
3. අධ්‍යාපනය සහ සෞඛ්‍යය

33. වඩු කර්මාන්තයේ දී ලීයක් මත රේඛාවක් ඇද ගැනීමට භාවිතා කරයි.

1. යතු කැටය
2. යවකාරය
3. වරක්කලය

34. ජලයේ ගිල්වා තබා ගැනීමෙන් බොහෝ කාලයක් නරක් නොවී තබාගත හැක්කේ,

1. පුවක්
2. මුං ඇට
3. කොස් ඇට

35. අර්ධ ලෙස සකස් කළ ආහාර වර්ගයක් වන්නේ,

1. මී කිරි
2. කඩල
3. නූඩ්ල්ස්

36. ඇඳ සිටින ඇඳුමට ගිනි ඇවිලී ඇති කෙනෙකු ඉක්මනින් ම කළ යුත්තේ,

1. හැකි ඉක්මනින් වතුර ඇති තැනකට දිවීම
2. බිම පෙරලීමට සැලැස්වීම
3. රෙද්දකින් එතීම

37. රෙදි මැසීමේ දී භාවිත කරන ආරක්ෂිත උපකරණයකි.

1. දිදාලය 2. මුඛ ආවරණය 3. අත්වැසුම්

38. ආචාර්ය සී.ඩබ්.ඩබ්. කන්නන්ගර මැතිතුමා,

1. ජාතියේ පියා ය 2. නිදහස් අධ්‍යාපනයේ පියා ය
3. බත් දුන් පියා ය.

39. චුම්බකයකට ඇදී එන ද්‍රව්‍ය පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. රත්තරන්, යකඩ ඇණය , පිත්තල ඇණය
2. ඉදිකටුව , යකඩ ඇණය , ලී කුඩු
3. යකඩ ඇණ , ඉදිකටුව , කම්බි ඇණ

40. ශ්‍රී ලංකාවේ මුහුදට මායිම් නොවූ දිස්ත්‍රික්කය වන්නේ,

1. හම්බන්තොට 3. පුත්තලම 3. මහනුවර

41. ජාතික කොඩිය අඩකුඹු කරන අවස්ථාවකි,

1. ජාතික ශෝක දිනයක දී 2. රජයේ නිළධාරියෙක් මිය ගිය විට
3. විදේශීය නායකයෙක් පැමිණි විට

42. පෞද්ගලික පරිහරණය කරන උපකරණයක් නොවේ,

1. දත් බුරුසුව 2. පුටුව 3. ලේන්සුව

43. පස සාරවත් කර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාව කුමක් ද?

1. බෝග වගාවේ දී කෘමි නාශක ඉසීම
2. දිරාපත් වන කුණු රොඩු පසට එක් කිරීම
3. සෑම විට රත් වූ ජලය පසට යෙදීම

44. අතීතයේ සෙක්කුව කැරකැවීමට යොදා ගත් සතෙකු වන්නේ,

1. බුරුවා 2. අලියා 3. ගවයා

45. රාජ්‍ය ලාංඡනයේ ඇති වී කරල් වලින් නිරූපණය වන්නේ,

1. සෞභාග්‍ය හා පරිපූර්ණ බවයි 2. සදාතන පැවැත්මයි
3. ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වයයි

46. නිවසේ විදුලි බුබුළක් මාරු කිරීමේ දී සිදු නොකළ යුතු ක්‍රියාවකි.

1. ප්‍රධාන පරිපථ යොමුව විසන්ධි කිරීම
2. බල්බය ගැළවීමට තෙත රෙදි කැබැල්ලක් යොදා ගැනීම
3. බල්බය ගැළවීමට පෙර අදාළ ස්විචය විසන්ධි කිරීම

47. මැලේරියාව රෝගය බෝ විය හැක්කේ,

1. රෝග වාහක මැස්සෙකු මගිනි
2. රෝග වාහක මදුරුවෙකු මගිනි
3. රෝග වාහක පුද්ගලයෙකු මගිනි

48. තමාගේ පදිංචිය පිළිබඳව සහතිකයක් ලබා ගැනීම සඳහා හමුවිය යුතු නිලධාරියෙක් වන්නේ,

1. ග්‍රාම නිලධාරි
2. සමෘද්ධි නිලධාරි
3. කෘෂිකර්ම නිලධාරි

49. සාමූහිකව කටයුතු කිරීමෙන් ජය ලබා ගත හැකි බව දැක්වෙන කතාවකි,

1. කපුටා හා කේජු කැල්ල
2. තොප්පි වෙළෙන්දාගේ කතාව
3. වටු කුරුල්ලාගේ කතාව

50. වනාන්තරයක ඇවිදීමේ දී මාලිමාවක් රැගෙන යාම වැදගත් වන්නේ ඇයි?

1. දුර සිටින සතුන් නිරීක්ෂණයට
2. වටිනා ශාක වර්ග හඳුනාගැනීමට
3. යා යුතු දිශාව සොයා ගැනීමට

51. ඇම්බැක්කේ දේවාලය ප්‍රසිද්ධ වී ඇත්තේ,




1. ලී කැටයම් සඳහා ය
2. ගල් කැටයම් සඳහාය
3. බිතු සිතුවම් සඳහාය

52. 

රූපයේ දැක්වෙන ලාංඡනය මගින් නිරූපණය වන්නේ,

1. ශ්‍රී ලංකා ගුවන් සේවයයි
2. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවයි
3. ශ්‍රී ලංකා තැපැල් සේවයයි

53. අයිස් කැටයක් ජලයට දැමූ විට පෙනෙන නිවැරදි අයුරු වන්නේ,


1. 
2. 
3. 

54. පහත දැක්වෙන ස්ථාන අතුරෙන් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත්තේ,

1. සිංහරාජ වනාන්තරය
2. පේරාදෙණිය උද්භිත උද්‍යානය
3. පින්නවල අලි අනාථාගාරය

55. පොළොව මත එකතුවන අපද්‍රව්‍ය දිරාපත් කිරීමට උදව්වන සතෙකි.

1. වේයා
2. දිමියා
3. මීයා

56. 

මෙම රූපයෙන් දැක්වෙන්නේ,

1. අනිලමානයකි,
2. ජල රෝදයකි
3. සුළං දිශා දර්ශකයකි

57. ශ්‍රී පාද වන්දනා සමය ආරම්භ වන පෝය වන්නේ,


1. දුරුතු 2. වෙසක් 3. උඳුවප්

58. පුස්තකාලය තුළ අප සිටිය යුතු නිවැරදි හැසිරීමකී,

1. ශබ්ද නගා කෑ ගැසීම 2. හඬ නැගෙන සේ සිනාසීම
3. නිශ්ශබ්දව අන් අයට බාධා නොවන සේ හැසිරීම.

59. ''මගේ සිත නිවීමෙන් ලැබෙන සැනසිල්ල මට දැනේවා !'' මෙය මානසික හා කායික සුවපත්භාවය උදෙසා කරන ක්‍රියාකාරකම් වල කුමන අංගය ද?,

1. අධිෂ්ඨානය 2. ප්‍රාර්ථනාව 3. උදානය

60. 

මෙම රූපයේ B අකුරින් දක්වා ඇති උපකරණය හඳුන්වන්නේ,

1. දොඹකරය
2. දබරය
3. කප්පි

(ලකුණු 30)

61 . මම පාසල අවසන් වී නිවසට යන අතර මඟ පාර අයිනේ අසරණව සිටි කුඩා බලු පැටවෙකු හඬමින් සිටිනු දුටුවෙමි. මම ඒ බලු පැටවා අසළට ළං වී බැලුවෙමි....ඉන් පසු සිදු වූ සිදුවීම ඔබේ වචනයෙන් ලියන්න. සෑම වාක්‍යයක ම වචන පහකට වඩා තිබිය යුතු අතර උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි විය යුතු ය.

1. .....

.....

2. .....

.....

3. .....

.....

(ලකුණු 6)